2024.08.

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## පුරවැසි අධ්‍යාපනය

විභාග අංකය ......................

**8 ශ්‍රේණිය** **කාලය පැය 2යි**

පොදු උපදෙස්

❖ (i) කොටස සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

### I කොටස

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

1) රජය විසින් නොමිලේ ලබා දෙන පොදු සේවාවකි,

i) විදුලිය ii) අධ්‍යාපනය
iii) ප්‍රවාහනය iv) තැපැල් සේවා

2) ශ්‍රී ලංකා පොලිසිය මඟින් ඉටු කරන සේවාවක් නොවන්නේ,

i) නීතිය හා සාමය ආරක්ෂා කිරීම. ii) මහජන ආරක්ෂාව සැපයීම.
iii) මාර්ග ආරක්ෂාව හා රථවාහන හැසිරවීම. iv) ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3) ශ්‍රී ලංකාවේ අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව වන්නේ,

i) අවු.05ත් 18ත් අතරය. ii) අවු.07ත් 18ත් අතරය.
iii) අවු.05ත් 16ත් අතරය. iv) අවු.12ත් 18ත් අතරය.

4) වර්තමානයේ බහුලව පවතින බෝ නොවන රෝගය වන්නේ,

i) කැස්ස ii) පාචනය
iii) දියවැඩියාව iv) උණ්ඩුරු

5) පවුලේ සියලුදෙනා එකට එකතු වී ගන්නා විශේෂ තීරණයකි,

i) නිවස පිරිසිදුව තබා ගැනීම ii) විවේකය ගතකිරීම හා විනෝද වීම
iii) ආහාර වේල් තෝරා ගැනීම iv) වාහනයක් මිලදී ගැනීම

6) පරිසර සංරක්ෂණය සඳහා රජය විසින් පිහිටුවා ඇති ආයතනයකි,

i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ii) ලංකා විදුලි බල මණ්ඩලය
iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය iv) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

7) ළමා අයිතිවාසිකම් ආරක්ෂාකර දීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ආයතනයක් නොවන්නේ,

i) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
iii) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය iv) ළමා හා කාන්තා කාර්යාංශය - ශ්‍රී ලංකා පොලිසිය

8) හින්දු ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සවයකි,

| | | | |
|---|---|---|---|
| i) | පාස්කු උත්සවය | ii) | දීපවාලි උත්සවය |
| iii) | රාමසාන් උත්සවය | iv) | ඇසළ උත්සවය |

9) ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසියක් නොවන්නේ,

i) ජන කොටස් අතර අසමගිය වර්ධනය.
ii) ජන කොටස් අතර විශ්වාසය කහවුරු කිරීම.
iii) රට සංවර්ධනයට සියලුදෙනාගේ දායකත්වය ලැබීම.
iv) ජන කොටස් අතර සුහදතාවය වර්ධනය වී ගැටුම් අවම වීම.

10) නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ,

| | | | |
|---|---|---|---|
| i) | ඩී.එස්.සේනානායක මැතිතුමාට ය. | ii) | සී. ඩබ්.ඩබ්.කන්නංගර මැතිතුමාට ය. |
| iii) | විලියම් ගොපල්ලව මැතිතුමාට ය. | iv) | මාර්ටින් වික්‍රමසිංහ මැතිතුමාට ය. |

අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ යොදන්න.

11) යුනිසෙෆ් සංවිධානය ළමා අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයකි. ( )

12) අනුගාමිකයා යනු නායකත්වයට අනුව කටයුතු කරන්නා ය. ( )

13) බෞද්ධ ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සලකනු ලබන මක්කම වන්දනා සමය සැමරීමට හජ් උත්සවය පවත්වයි. ( )

14) මානසික රෝග අයහපත් චිත්ත වේගවල ප්‍රතිඵලයකි. ( )

15) එකා සැමටත් සැම එකාටත් යනු ශ්‍රී ලංකා පොලිසියේ ආදර්ශ පාඨයයි. ( )

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී X හා Y තීරු නිවැරදි ලෙස ගළපා අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ ලියන්න.

| X තීරුව | | Y තීරුව |
|---|---|---|
| 16. භාවනා කිරීම. | ( ) | A. ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු ගුණාංගයකි. |
| 17. නව දැනුම ලබා දීම. | ( ) | B. ළමා අයිතිවාසිකමකි. |
| 18. මානව හිතවාදී ගුණය | ( ) | C. ඒකාධිපති නායකත්ව ශෛලියකි. |
| 19. නිසි රැකවරණය ලැබීම. | ( ) | D. අධ්‍යාපනය මගින් ඉටුකරන කාර්යභාරයකි. |
| 20. පොදු ජනතා අදහස් පිළිනොගැනීම. | ( ) | E. අයහපත් චිත්තවේග සමනය කරයි. |
| | | F. සෞඛ්‍යය සේවාවකි. |

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

01.

i) ඔබ ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන පොදු සේවාවන් දෙකක් ලියන්න.
ii) ප්‍රධාන ජන සන්නිවේදන මාධ්‍ය දෙකක් සඳහන් කරන්න.
iii) නායකයකු සතු විය යුතු ගුණාංග දෙකක් ලියන්න.
iv) චිත්තවේග දෙකකට උදාහරණ දෙකක් සඳහන් කරන්න.
v) දරුවන්ට පවුල තුළින් ලබා ගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග දෙකක් සඳහන් කරන්න.
vi) සංස්කෘතියට අයත් වන ප්‍රධාන අංග දෙකක් සඳහන් කරන්න.
vii) ශ්‍රී ලංකාව තුළ ආගම පදනම් කරගෙන ගොඩනැගී ඇති සංස්කෘතීන් දෙකක් සඳහන් කරන්න.
viii) වර්තමාන සමාජයේ දරුවන්ට මුහුණ දීමට සිදුවන ගැටලු දෙකක් සඳහන් කරන්න.
ix) වර්තමානයේ මිනිසාට මුහුණ පෑමට සිදු වී ඇති ස්වභාවික විපත් දෙකක් සඳහන් කරන්න.
x) ලෝකයේ බහු සංස්කෘතික සමාජ සහිත ප්‍රධාන රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 2X10 = 20)

02.

i) මහජනතාව වෙත සේවා සපයන ආකාරය අනුව පොදු සේවා වර්ග කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
ii) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
iii) පොදු සේවා වල දැකගත හැකි ලක්ෂණ 05 ක් ලියන්න. (ලකුණු 05)

03.

i) පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
ii) පාසල් ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපන ලැබීමේ අයිතිය ලබා ගැනීමේදී ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
iii) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

04.

i) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ප්‍රධාන ජන වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
ii) බහු සංස්කෘතික සමාජයක දැකගත හැකි ලක්ෂණ 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)
iii) බහු සංස්කෘතික සමාජයක ජීවත් වන පුරවැසියකු වශයෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 05ක් සඳහන් කරන්න. (ලකුණු 05)

05.

i) පොදු ප්‍රවාහන සේවා භාවිතය නිසා අත්වන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
ii) පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
iii) විදුලිය භාවිත කිරීමේදී ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් 05ක් ලියන්න. (ලකුණු 05)

06.

i) සමාජය තුළ දැක ගත හැකි නායකත්ව ශෛලීන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
ii) ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු විය යුතු ගුණාංග 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
iii) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ජීවත්වීමේදී ඔබ විසින් අනුගමනය කළ යුතු ගුණාංග 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

07.

i) වර්තමානයේ මුහුණ පෑමට සිදු වී ඇති අනතුරු හා විපත් ඒවායේ ස්වභාවය අනුව බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)
ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් 03ක ලියන්න. (ලකුණු 03)
iii) අකුණු වලින් සිදුවන හානි වළක්වා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 05ක් සඳහන් කරන්න. (ලකුණු 05)



REGIS...
D...College
Kandana.